මධ්‍යම පළාත් රාජ්‍ය සේවය

ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ මධ්‍යම පළාත් තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1094/2 හා 1999 අගෝස්තු 23 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පදනම් කරගෙන මධ්‍යම පළාතට ගැලපෙන අයුරු වෙනස්කම් සහිතව 1998.09.23 දිනැතිව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කරනු ලැබ ඇති තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට ආදේශ වශයෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාර තුමා 2000.03.20 දින අනුමත කළ මධ්‍යම පළාත් තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය , රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් 2000.01.26 දිනෙන් නිකුත් කරන ලද රා.පරි. චක්‍රලේඛ අංක:4/2000 න් ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ ඇති කරන ලද සංශෝධන ඇතුලත් කරමින් මෙම ව්‍යවස්ථා සංග්‍රහය ස්ථාපනය කරනු ලැබේ. ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට වරින් වර කරනු ලබන සංශෝධන මධ්‍යම පළාත් තාක්ෂණ සේවාවටද අවශ්‍ය අවස්ථා වලදී උචිත වෙනස්වීම් වලට යටත්ව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතියෙන් ක්‍රියාත්මක කළ විය යුතුය.

1.0 ක්‍රියාත්මක වන දිනය:- මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියට බලපැවැත්වෙන ප්‍රතිපාදන අනුව ගන්නා ලදැයි අදහස් කරනු ලබන කිසියම් පියවරකට අගතියක් නොවන අයුරින් මෙම ව්‍යවස්ථා සංග්‍රහය 1994 ජුලි මස 01 වෙනි දින සිට බලපැවැත්වෙනු ඇත. මෙම දිනයේ සිට පවත්නා බඳවා ගැනීම් පරිපාටින් හා උසස්වීම් ක්‍රම ක්‍රියාත්මක වීම නතර වනු ඇත.

(1) ඇතුලත් වන සේවාවන්:- විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳව පුහුණුව ලබාගත යුතු සියළුම සේවාවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් වේ.
අර්ධ වෘත්තීය සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් ලත් හා පුහුණුව හා පළපුරුද්ද මත කළමණාකරණ මට්ටමට ලඟා විය හැකි සහ කළමණාකරණ සේවා වන, ඉංජිනේරු, විද්‍යාත්මක කෘෂිකර්ම හා සත්ව නිෂ්පාදන වැනි වෘත්තීයමය සේවාවන්ට පරිපූරක වන්නා වූ සේවාවන් වේ.

2.0 අර්ථ නිරූපනය:-

(අ) 'ව්‍යවස්ථා සංග්‍රහය' යන පදයෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ මධ්‍යම පළාත් තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයයි.

(ආ) 'ලේකම්' යන පදයෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

(ඇ) 'සේවාව' යන පදයෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ මධ්‍යම පළාත් තාක්ෂණ සේවාවයි.

(ඈ) 'මණ්ඩලය' යන පදයෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය වේ.

(ඉ) 'රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්' යනුවෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වේ.

(ඊ) 'ගැසට් පත්‍රය' යන පදයෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයයි.

02 ......

(උ) 'සතුටුදායක සේවා කාලය' යනුවෙන් අදහස් වන්නේ උසස්වීම් දිනට පූර්වාසන්න වසර 05 ක සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තාවූද, අවවාද කිරීමක් හැර වෙනත් කිසිදු විනය දඬුවමකට භාජනය වී නැත්තාවූද සේවා කාලයයි.

3.0 මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටළු පිළිබඳව අවශ්‍ය උපදෙස් අවස්ථානුකූලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1999 අගෝස්තු 23 වෙනි දින නිකුත් කරන ලද අංක:1094/2 දරණ ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ශ්‍රී ලංකා තාක්ෂණ සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පරිච්ඡේද 03 යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලයෙන් ලබාගනු ඇත.

4.0 වැටුප් ප්‍රමාණ ව්‍යුහය හා සේවක සංඛ්‍යාව:-පුහුණු කිරීමේ ශ්‍රේණියේ සිට 01 වන පංතිය දක්වා සේවක සංඛ්‍යා අනුපාතයක් නොමැති වන අතර, මුළු තනතුරු සංඛ්‍යාව එක් එක් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව තීරණය කරනු ඇත.

විශේෂ පංතිය :- රු:52320-15X1560-75720/= වේ.
1 වන පංතිය :- රු:48720-8X1200-10X1560-73920/= වේ.
11වන පංතියේ'අ'බණ්ඩය :- රු:37200-4X780-14X1200-57120/=වේ
(11 පංතියේ 'අ' බණ්ඩයේ නිළධාරින් 03 වන වැටුප් වර්ධකයට පෙර 11 පංතියේ 'අ'බණ්ඩයේ නිළධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය.)
11 පංතියේ'ආ'බණ්ඩය :- රු:30060-5X680-11X780-41940/=වේ.
(11 පංතියේ 'ආ' බණ්ඩයේ නිළධාරින් 03 වන වැටුප් වර්ධකයට පෙර 11 පංතියේ 'ආ' බණ්ඩයේ නිළධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය)
පුහුණු කිරීමේ ශ්‍රේණිය :- රු:28740-1X660-29400(වාර්ෂික)

පහත සඳහන් වැටුප් ක්‍රම 1997.01.01 දින සිට බලපැවැත්වේ.

විශේෂ පංතිය :- රු:92580-15X2460-129480/= වේ.
1 වන පංතිය :- රු:74160-13X1560-5X2460-106740/=වේ.
11 වන පංතියේ'අ'බණ්ඩය:- රු:58440-1X1320-13X1560-80040/=වේ.
(11 වන පංතියේ 'අ' බණ්ඩයේ නිළධාරින් 03 වන වැටුප් වර්ධකයට පෙර 11 පංතියේ 'අ' බණ්ඩයේ නිළධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය)
11 පංතියේ 'ආ' බණ්ඩය:- රු:51840-7X1320-10X1560-76680/= වේ.
(1 වන පංතියේ 'ආ' බණ්ඩයේ නිළධාරින් 03 වන වැටුප් වර්ධකය ලැබීමට පෙර 11 පංතියේ 'ආ' බණ්ඩයේ නිළධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය.)
පුහුණු කිරීමේ ශ්‍රේණිය:-රු:49200-1X1320-50520/= වේ.

මෙම වැටුප් පරිමාණයන් රජය මගින් කලින් කල කෙරෙන සංශෝධන වලට යටත්වේ.

සටහන: (අ) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ 6:4 ඡේදයේ සඳහන් ඊට සමාන තාක්ෂණික සුදුසුකම් සහිත අයදුම්කරුවන් 11 පංතියේ 'ආ' ඛණ්ඩයට බඳවා ගැනේ. යම් විශේෂ පුහුණුවක් අවශ්‍ය වන්නේනම් එයද ලබාදෙනු ඇත.

(ආ) සැළසුම් ශිල්පීන්ගේ පුහුණු පාඨමාලාව හෝ ජාතික තාක්ෂණික සහතිකය හෝ වෙනත් ඊට සමාන යයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන සහතික ලත් අයදුම් කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කරනු ලබන අතර, එහි එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු කාලසීමාවකින් පසුව 11 පංතියේ 'ආ' ඛණ්ඩයට බඳවා ගැනේ.

(ඇ) විවෘත තරඟ විභාගයෙන් තාක්ෂණ සේවයේ පුහුණු ශ්‍රේණියකට සුදුසුකම් ලබන නිළධාරියෙකු , එනම් 6:3 ඡේදයේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් පමණක් ලබා ඇති (අ.පො.ස. (උ.පෙ.) හා අ.පො.ස.(සා.පෙ.) එහෙත් තාක්ෂණික සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් පුහුනු කිරීමේ ශ්‍රේණියේ පිහිටුවනු ලබන අතර, අවුරුදු දෙකක පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු ඔවුනට 11 වන පංතියේ 'ආ' ඛණ්ඩයේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

(ඈ) දෙපාර්තමේන්තුමය විභාග වලින් පුහුනු කිරීම් ශ්‍රේණියට තෝරා ගන්නා නිළධාරීන් තමන් කලින් දැරූ වැටුප් පරිමාණ යේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වන විභාගය සමත් වනතුරු , ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු ශ්‍රේණියේ සතුටුදායක ලෙස ගත කරන නිලධාරියෙකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඉහළ වැටුප් තලයෙහි පිහිටුවනු ලබන අතර, දීමනාව තවදුරටත් ගෙවනු ලැබේ. විභාගය සතුටුදායක ලෙස සම්පූර්ණ කළ විට, 1995.02.11 දිනැති අංක 11/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව වැටුප් පරිවර්තනය කරනු ලැබේ.

(ඉ) දෙවසරකට වඩා වැඩි පුහුණුවක් අවශ්‍ය යම් විශේෂ සේවාවක් වේනොත් එම අතිරේක පුහුණුවීමට සැලකීමක් වශයෙන් අතිරේක පුහුනු එක් වසරක් වෙනුවෙන් එක් වැටුප් වර්ධකයක්

බැගින් ලබාදීමේ පදනම මත පුහුණුව අවසානයේ '11' පන්තියේ 'අ' ඛණ්ඩයට බඳවා ගනු ලබන අතර, අතිරේක පුහුණු කාල සීමාව 11 පංතිය 'අ' ඛණ්ඩයට උසස්වීම සඳහා සළකනු ලබන කාල සීමාවට ගණන් ගනු ලැබේ.

5.0 එක් එක් පංතියේ තනතුරු සංඛ්‍යාව:

විශේෂ පංතියේ පැවති තනතුරු සංඛ්‍යාව ඒ ඒ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා හා නිළධාරින්ගේ උසස්වීමේ අවශ්‍යතාවයද සැළකිල්ලට ගෙන ආයතන සංග්‍රහයේ 11 වන පරිච්ඡේදයේ 1 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් නිර්දේශ කරනු ඇත. 11 වන පංතියේ 'ආ' ඛණ්ඩයේ සිට 1 වන පංතිය දක්වා සේවක සංඛ්‍යා අනුපාතයක් නොතිබිය යුතු අතර, නිළධාරින් උසස්වීම් ලබාගන්නා ආකාරය අනුව දෙපාර්තමේන්තුවට අනුමත මුළු තනතුරු සංඛ්‍යාව නොඉක්මවන සේ ශ්‍රේණිවල සංයුතිය තීරණය වනු ඇත.

සටහන:

විශේෂ පංති තනතුරු ඇති කිරිම දෙපාර්තමේන්තු අවශ්‍යතාවය අනුව සිදුවිය යුතු අතර, විශේෂ පංතියක් නොමැති සියළුම සේවා වලට එම පංතියේ තනතුරු නොපමාව ඇති කළයුතුය.

6.0 බඳවා ගැනිම :

6:1 බඳවා ගැනිමේ පංතිය වන 11 'අ' පංතියේ පුරප්පාඩු සංඛ්‍යාවෙන් 90% ක් විවෘත තරඟ විභාගයකින්ද, 10%ක් සුදුසුකම් ලත් දෙපාර්තමේන්තු සේවකයන්ගෙන්ද සම්පූර්ණ කෙරේ.

6:2 සියළුම බඳවා ගැනීම් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ සිදුකෙරේ.

6:3 පුහුණු කිරිමේ ශ්‍රේණියට ඇතුලත් කර ගැනිම සඳහා පහත (1) හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ පහත (11) හි සඳහන් මූලික තාක්ෂණ සුදුසුකම් සහ අධ්‍යාපන සුදුසුකම් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතුය.

(1) සේවයට අදාල විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් 03 කින් අ.පො.ස.(උ.පෙ.) එක්වර සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙ.)විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී

සමත්වීම:

හෝ

(11) ජාතික තාක්ෂණ සහතිකය හෝ රජයේ කාර්මික විද්‍යාලයක සැළසුම් ශිල්පය පිළිබඳව එක් අවුරුදු පූර්ණකාලීන පුහුණු පාඨමාලාව හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලැබූ වෙනත් තාක්ෂණ සුදුසුකමක්

සහ

භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/ගණිතය , විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙ.)විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

6:3:1 ඉහත(1) යටතේ මූලික අධ්‍යාපන සුදුසුකම් පමණක් ලබා ඇති අ.පො.ස.(උ.පෙ.)සහ අ.පො.ස.(සා.පෙ.)අයදුම්කරුවන් සේවයට අදාල විෂය නිර්දේශ අනුව ලබාගන්නා දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාල විභාගය සමත්වීමෙන් අනතුරුව , ඉහ. 4.0 ඡේදයේ(ඇ)ප්‍රකාර බඳවා ගැනීමේ පංතිය වන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 11 පංතියේ 'ආ' ඛණ්ඩයට පත් කෙරේ.

6:3:2 දෙපාර්තමේන්තු සේවකයින් අතුරින් දෙපාර්තමේන්තු පරීක්ෂණයක ප්‍රතිඵල මත, පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරා ගනු ලබන අයදුම්කරුවන් අදාල බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කරුණු පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු දෙපාර්ත--මේන්තුව විසින් පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවා 11 පංතියේ 'ආ' ඛණ්ඩයට ඇතුලත් කෙරේ.

6:3:3 ජාතික තාක්ෂණික සහතිකය හෝ 6:3 ඡේදයේ සඳහන් ඊට සමාන වෙනත් පිළිගත් තාක්ෂණික සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කෙරෙන අතර, සේවයට අදාල විෂය නිර්දේශයට අනුව ලබාගන්නා එක් අවුරුදු න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු කාලසීමාව අවසානයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් අනතුරුව ගහත 4.0 ඡේදයේ (ආ) සටහන ප්‍රකාර (11 පංතියේ 'ආ' ඛණ්ඩයට)ඇතුලත් කෙරේ.

6:4 බඳවා ගැනීමේ සුදුසුකම්:-

6:4:1 පුරප්පාඩු වලින් 90%ක් වන බාහිර අයදුම්කරුවන් ගෙන් පුරවනු ලැබේ.

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 11'ආ'ඛණ්ඩයට ඉහත 6:3(11) යටතේ බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී තිබිය යුතු තාක්ෂණික සුදුසුකම් ලෙස මෙහි පහත සඳහන් සුදුසුකම් පිළිගනු ලැබේ.

06 .......

(1) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව.

(11) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව.

(111) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

(1V) රජය විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන දැවුරුදු තෘෂිතම් ඩිප්ලෝමාව.

(V) විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව.

(V1) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පලමු වන කොටස සාර්ථක සම්පූර්ණ කිරීම.

(V11) ඉහත තාක්‍ෂණික සුදුසුකම් වලට සමාන යයි ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

සටහන:- ඉහත(V) හි සඳහන් විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමා හිමි අයදුම්කරුවන් එම ඩිප්ලෝමාව හැදෑරීමට ඇතුලත්වීම සඳහා වන 'පදනම් පාඨමාලාව' සාර්ථකව හදාරා ඇත්නම් ඔවුන් අ.පො.ස.(සා.පෙ.) විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැක.

එසේ වුවත් මොවුන් රාජ්‍ය භාෂාවේ ප්‍රවීනතාවය පිළිබඳ අවශ්‍යතාවය සපුරා තිබිය යුතුය. තවද අංක 1094/2 දරණ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවාව පිලිබඳ ව්‍යවස්ථාවේ 6.3(11) හි සහ 6:4:1 හි සඳහන් තාක්‍ෂණ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් එම පාඨමාලා හැදෑරීමට බඳවා ගන්නා අවස්ථාවේදී එම පාඨමාලාවන්ට ඇතුලත්වීමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

6:4:2 පුරප්පාඩු වලින් 10 % ක් වන දෙපාර්තමේන්තු සේවකයින් සඳහා:-

භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/ගණිතය හා විද්‍යාවට සම්මාන සාමාර්ථය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙ.) විභාගය විෂයයන් 06 කින් සමත්ව අදාල ක්ෂේත්‍රයේ වසර 10 ක පළපුරුද්ද ලබා ඇති දෙපාර්තමේන්තු සේවකයින් අතුරින් දෙපාර්තමේන්තු පරීක්ෂණයක ප්‍රතිඵල මත පුහුණු කිරීම් ශ්‍රේණියට ඇතුලත් කෙරේ.

මේ සඳහා තෝරා ගනු ලබන්නේ යටත් පිරිසෙයින් පුහුණු කාර්මික ශ්‍රේණිවල 1 පංතියේ 11 ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අය අතුරිනි.

7.0 බඳවා ගැනීමේ ක්‍රමය:- සියළුම බඳවා ගැනීම් කරනු ලබන්නේ විටින් විට නිකුත් කරනු ලබන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල හා ආයතන සංග්‍රහයේ නියමයන්ට අනුව විය යුතුයි. නිත්‍ය තනතුරු වලට කෙරෙන පත් කිරීම් සඳහා මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව යම් තනතුරකට විශේෂ වන විධිවිධාන ඇතුලත් කරමින් බඳවා ගැනීම් පරිපාටි අනුමත කිරීම මධ්‍යම පළාත් ආණ්ඩුකාර තුමා විසින් කරනු ඇත. ඒ අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීම් කළයුතු වේ.

8.0 උසස් කිරීමේ පරිපාටිය:-

8.1 (අ) 11 'ආ' පංතියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම සමත් 11 පංතියේ 'ආ' බණ්ඩයේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් ඇති පලමු දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් නිළධාරින් 11 පංතියේ 'අ' බණ්ඩයට උසස් කරනු ලැබේ.

(ආ) 11 පංතියේ ආ බණ්ඩයේ නිළධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් සමත්ව ඇති 11 පංතියේ 'ආ' බණ්ඩයේ වසර 12 ක සේවා කාලයක් සහිත උසස්වීම් කරන දිනට සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇත්තාවූ නිලධාරින් 11 පංතියේ 'අ' බණ්ඩයට උසස් කෙරේ.

8.2 (අ) 11 පංතියේ 'අ' බණ්ඩයේ නිළධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම සමත් 11 පංතියේ 'අ' බණ්ඩයේ අවුරුදු 04 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් නිළධාරින් පලමු වැනි පංතිට උසස් කරනු ලැබේ

(ආ) 11 පංතියේ 'අ' බණ්ඩයේ නිළධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම සමත් 11 'අ' බණ්ඩයේ අවුරුදු 10 ක සේවා කාලයක් සහිත උසස්වීම් පිරිනැමීමේ දිනයට සතුටුදායක සේවා කාලයක් ඇති නිළධාරින් පලමු වැනි පංතියට උසස් කරනු ලැබේ.

8.3 1 වන පංතියේ සිට විශේෂ පංතියට :-

(අ) විශේෂ පංතියේ පුරප්පාඩු වලින් 40%ක් පලමු වන පංතියේ අවුරුදු 04 ක සතුටුදායක සේවා කාලයක් ඇති නියමිත විභාගයෙන් සමත් නිලධාරීන් ගෙන් පුරවනු ලැබේ.

(ආ) විශේෂ පංතියේ පුරප්පාඩු වලින් 60%ක් පලමු වන පංතියේ අවුරුදු 06 ක සතුටුදායක සේවා කාලයක් ඇති නිළධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය මත පුරවනු ලැබේ.

8.4 වෘත්තිමය සේවා වලට කරනු ලබන උසස්වීම් :-

දෙපාර්තමේන්තු වල වෘත්තිමය සේවා වල සේවක සංඛ්‍යාවෙන් යම්කිසි ප්‍රතිශතයක් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පලමු වැනි පංතියේ නිළධාරීන් ගෙන් විභාගයකින් තෝරා ගනු ලබන අයගේ උසස් වීම් සඳහා වෙන් කරයි. එවැනි උසස්වීම් මාර්ග නොමැති තාක්ෂණ සේවාවන් සඳහා ද එම මාර්ග ව්‍යාප්ත කළ යුතුයි.

9.0 දෙපාර්තමේන්තු පරීක්ෂණ හා කාර්යක්ෂමතා කඩඉම් :-

(1) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 11 පංතියේ 'ආ' සහ 11 පංතියේ 'අ' පංතියේ කාර්යක්ෂමතා කඩඉම් විභාග විභාග දෙපාර්ත--මේන්තුව විසින් පැවැත්විය යුතු වේ. දෙපාර්තමේන්තු පරීක්ෂණ ඒ ඒ දෙපාර්තමේන්තුව විසින් පැවැත්විය යුතුයි. මුදල් රෙගුලාසි සහ ආයතන සංග්‍රහය යටතේ ප්‍රශ්ණ දෙපාර්තමේන්තු පරීක්ෂණ වලට ඇතුලත් නොවිය යුතුයි. දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කටයුතු වලට අදාල කරුණු වලට අමතරව දෙපාර්ත--මේන්තු රීති සහ රෙගුලාසි පණත් ක්‍රියා පිළිවෙත් ආදියට අදාල ප්‍රශ්ණද දෙපාර්තමේන්තු පරීක්ෂණ වලට ඇතුලත් ව විය යුතුයි.

සටහන:- ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් විභාග වල විෂයයන් සහ විෂය නිර්දේශ 'අ' උපලේඛණයේ සඳහන් වේ.

(11) සියළුම කාර්යක්ෂමතා කඩඉම් ලිඛිත විභාග විය යුතුයි. මෙම විභාග වලින් සමත්වීම අනිවාර්ය වන අතර, වයස නිසා මෙයින් නිදහස් වීමට කිසිවකුට අයිතිවාසිකමක් නොමැත.

(111) ඉහත 6.4 ඡේදයේ නියමිත සුදුසුකම් වලින් එක් සුදුසුකමක් ලබා සිටින නිළධාරින්ට පලමු වන දෙපාර්තමේන්තු පරීක්‍ෂණ--යේ තාර්මික විෂයයන් ගෙන් නිදහස් වීමට අයිතිවාසිකම් ඇත. එසේ වුවද ඔවුහු දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි යන විෂයයෙන් සමත් විය යුතුයි.

(1V) 1999.08.23 වෙනි දිනට පෙර කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂ වලින් නිදහස් කර ඇති හා ඉදිරියේදී නිදහස් කරනු ලබන නිලධාරීන් වෙතොත් ඔවුන්ට පෞද්ගලික වනසේ නව ව්‍යවස්ථා--වේ සඳහන් උසස්වීම් සඳහා වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණ වලින් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(V) පලමු වන පංතියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරිම සඳහා කලමණාකරණය සහ අභියෝගයතාවය සම්බන්ධයෙන් ප්‍රශ්ණ පත්‍ර දෙකකින් සමන්විත විභාගයක් මණ්ඩලයේ මඟ පෙන්වීම යටතේ විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබේ. විශේෂ පංතියේ පුරප්පාඩු වලින් 40%ක් මෙම විභාගයෙන් සමත් අයගෙන් පුරවනු ලැබේ. එසේ වුවත් විශේෂ ශ්‍රේණියට උසස් කිරිමේදී ශ්‍රී ලංකා තාක්‍ෂන සේවයේ පලමු වැනි පංතියේ අවුරුදු 10 ක් හෝ ඊට වඩා පළපුරුද්දක් ඇති නිළධාරීන් කෙරේහි විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුයි. ඒ සඳහා පහත සඳහන් ප්‍රතිශතයන් අනුව නියමිත විභාගය සමත් නිළධාරින්ගෙන් පුරපාඩු පිරවිය යුතුයි.

2000.12.31 දක්වා 20%
2001.12.31 දක්වා 21%
2002.12.31 දක්වා 22% ....... යනාදි වශයෙන් එක් වර්ෂයකිදී 1% කින් වැඩි වන ආකාරයට 2020.12.31 සිට ඉදිරියට 40%. ක් වන පරිදි ක්‍රියාත්මක කෙරේ.

සටහන:- ඉහත සඳහන් විභාගයේ විෂයය නිර්දේශ 'ආ' උපලේඛණයෙන් දක්වා ඇත.

10.0 අන්තර්කාලීන විධිවිධාන:-

(1) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 27/94 හා 27/94 (1) මගින් මධ්‍යම මට්ටමේ තාර්මික සේවාවේ නිළධාරින් ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයට අන්තර්ග්‍රහණය කරන අවස්ථාව වන විට මධ්‍යම මට්ටමේ තාර්මික

සේවාවේ පලමු හා දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත්ව සිටි නිලධාරීන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පලමු හා දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණ සමත් වුවන් ලෙස සළකනු ලැබේ.

(11) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/94 හා 27/94(1) අනුව මධ්‍යම මට්ටමේ කාර්මික සේවාවේ නිලධාරීන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කරන අවස්ථාවේදී සිටි පංතියේ / ඛණ්ඩයේ හිමි සේවා කාලය අන්තර්ග්‍රහණය කරනු ලැබූ පංතියේ / ඛණ්ඩයේ සේවා කාලය ලෙස සලකනු ලැබේ.

(111) මධ්‍යම මට්ටමේ කාර්මික සේවා කාර්මික සේවා ව්‍යවස්ථාව යටතේ 1994.07.01 දින සිට 1996.03.22 දින අතර කාලසීමාව තුල ගෙන ඇති ඕනෑම ක්‍රියාමාර්ගයකට හානියක් නොවන පරිදි මෙම ව්‍යවස්ථාව 1994 ජුලි මස 01 දින සිට ක්‍රියාත්මක වේ. මධ්‍යමමට්ටමේ කාර්මික සේවා ව්‍යවස්ථාවේ නියමයන් අනුව 1994.07.01 දින සිට 1996.03.22 දින (දින දෙකම ඇතුලත් වන සේ) දක්වා කාල සීමාව තුළ 11 පංතියේ 'ආ' ඛණ්ඩයේ සිට 11 පංතියේ 'අ' ඛණ්ඩයට උසස්වීමට සුදුසුකම් තිබූ නමුත් එවැනි උසස්වීම් නොලද නිලධාරීන් සඳහා ඔවුන් සුදුසුකම් ලැබූ දිනයේ සිට ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව යටතේ උසස් වීම්ලබා ගැනිමට සුදුසුකම් ඇතැයි සළකනු ලැබේ.

(1V) මධ්‍යම මට්ටමේ කාර්මික සේවාවේ නිලධාරීන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කරන විට ඔවනුන් එම සේවාවේ යම් කාර්යක්ෂමතා කඩඉමක් සමත් වී හෝ නිදහස් වී සිටියේ නම් මෙම නව පරිපාටිය යටතේද ඔවුන් අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් වුවායේ සැලකිය යුතුයි. මෙය අදාල වන්නේ 1995.01.01 දිනට පෙර කාර්යක්ෂමතා කඩඉම යෙදෙන නිළධාරීන්ට පමණි.

01.
02.
03.
04.
05.

සත්‍ය ඡායාපිටපතක් බව සහතික කරමි

ලේකම්/පරිපාලන නිලධාරී
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
2006.06.30.

'අ' උපලේඛණය–කාර්යක්ෂමතා කඩඉම් විභාග

11 'ආ' පංතියේ නිළධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

මෙම විභාගය ප්‍රශ්ණ පත්‍ර 02 කින් සමන්විත වේ.

1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය (කාලය පැය 02 කි)
2. මුදල් රෙගුලාසි (කාලය පැය 02 කි)

අංක 01 ප්‍රශ්ණ පත්‍රය සඳහා විෂය නිර්දේශය:-

කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය

මෙම ප්‍රශ්ණ පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

| | |
|---|---|
| 11 වන පරිච්ඡේදය | – සේවයට බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටිය හා පත් කිරීම්. |
| 111 වන පරිච්ඡේදය | – ස්ථාන මාරු කිරීම්. |
| 1V. වන පරිච්ඡේදය | – මාස්පඩි තාවකාලික තත්ත්වය, ස්ථිරත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම. |
| V. වන පරිච්ඡේදය | – මුදාහැරීම, නැවත සේවයට ගැනීම සහ සේවය අවසන් කිරීම. |
| V111 වන පරිච්ඡේදය | – අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා |
| X11 වන පරිච්ඡේදය | – නිවාඩු |
| X111 වන පරිච්ඡේදය | – දුම්රිය බලපත්‍ර |
| X1V වන පරිච්ඡේදය | – දිවයින තුළ රාජකාරි ගමන් |
| X1X වන පරිච්ඡේදය | – රජයේ නිවාඩු |
| X/V11 වන පරිච්ඡේදය | – සාමාන්‍ය හැසිරීම හා විනය |

අංක 02 ප්‍රශ්ණ පත්‍රය සඳහා විෂය නිර්දේශය

මෙම ප්‍රශ්ණ පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

(1) 1 වන පරිච්ඡේදය
වියදම් හා ආදායම් ඇස්තමේන්තු
ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම.
(මු.රෙ. 1 සිට 68 දක්වා)

(2) 111 වන පරිච්ජේදය

මුල්‍ය කළමණාකරණය හා උත්තරදායි බව:-

ප්‍රධාන ගණක නිළධාරින්, ගණක නිලධාරින්, ආදායම් ගිණුම් නිළධාරින්, ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරිම, සහතික කිරිම, කාර්ය පැවරිම(මු.රෙ.124 සිට 147 දක්වා)

11'අ' පංතියේ නිළධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

---

මේ සඳහා ප්‍රශ්ණ පත්‍ර දෙකකි.

1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය(කාලය පැය 02කි)
2. මුදල් රෙගුලාසි (කාලය පැය 02 කි)

අංක 01 ප්‍රශ්ණ පත්‍රය සඳහා විෂය නිර්දේශය :-

කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය

මෙම ප්‍රශ්ණ පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ජේද මත සැකසේ.

| | |
|---|---|
| XV | අධ්‍යාපන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම. |
| XV1 | නිවාඩු ගමන් |
| XX111 | ඇතැම් වර්ගවල ලෙඩ රෝග වලින් පෙලෙන රජයේ නිළධාරින්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි. |
| XX1V | වැටුප් ණය සහ අත්තිකාරම් |
| XXV11 | ලිපි ගනුදෙනු කිරිමේ මාර්ග |
| XXV111 | පරිපාලන කාර්ය පරිපාටි හා විධි |
| XXX | රජයේ නිළධාරින් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල |
| XXX111 | නීති උපදෙස් හා නීති ක්‍රියාමාර්ග |
| X/X11 | සාමාන්‍ය හැසිරිම හා විනය |
| X/V111 | විනය කාර්ය පරිපාටි |

නිළධාරින්ගේ කාර්ය සාධන සහ ඇගයීම් පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ වේ.

අංක 02 ප්‍රශ්ණ පත්‍රය සඳහා විෂය නිර්දේශය.

මෙම ප්‍රශ්ණ පත්‍රය මුදල් රෙගුලාසි වල පහත සඳහන් පරිච්ජේද මත සැකසේ.

(1) V1 වන පරිච්ඡේදය

ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරිත්වය, ආග්‍රිමය හා බැංකු ගිණුම්:-
රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව, බැංකු ගිණුම්,
(මු.රෙ.315 සිට 396 දක්වා)

(2) X111 වන පරිච්ඡේදය

සැපයුම්, වැඩ හා සේවා :-
සැපයීම් මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ ගබඩාකරණ ක්‍රියාවලිය
කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැර වීම.
(මු.රෙ .708 සිට 775 දක්වා)

1 වන හා 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පිළිබඳ පොදු කරුණු:-

(1) ඉහත සඳහන් විභාග වාර්ෂිකව විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබේ.

(11) සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්ණ පත්‍රයකින් අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුයි.

(111) ඉහත සඳහන් විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.

'ආ' උපලේඛණය

විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා විභාගය

මේ සඳහා ප්‍රශ්ණ පත්‍ර දෙකකි.

01. අභියෝගයතා පරීක්ෂණය(කාලය පැය 1 1/2 කි)
02. කළමණාකරණය(කාලය පැය 2 1/2 කි)

සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්ණ පත්‍රයකින් අවම වශයෙන් 40% ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුවේ.

කළමණාකරණය ප්‍රශ්ණ පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ.

(1) කළමණාකරණ මූලධර්ම
(11) කළමණාකරණ ශ්‍රිතයන්

සැළසුම් කිරීම
තීරණ ගැනීම
තීරණ ගැනීමේ ක්‍රියාවලිය
සංවිධානය

මාණ්ඩලිකරණය

මෙහෙයවීම

අභිප්‍රේරණ ක්‍රියාවලිය

නායකත්වය

පාලනය

පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය

(111) සහභාගීත්ව කළමණාකරණය

(1V) කළමණාකරණ පරිසරය

(V) සිද්ධි අධ්‍යයනය

01.

02.

03.

04.

05.

සත්‍ය ඡායාස්ථ පිටපතක් බව සහතික කරමි

.................................................

~~ලේකම්~~/පරිපාලන නිලධාරි
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
2000.6.[illegible]

අනුමත කරමි.

2000.07.21

පී. කේ. දසනායක
මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර
මහනුවර.